# 2017 -------------- දින ගැසට් කරන ලද ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීති (2017)

තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින්, තොරතුරු දැනගැනීමේ පනතේ (පනත) 42 වගන්තිය යටතේ හිමි බලය මත පදනම් ව පරීක්ෂණ පැවැත්වීම සහ එයට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් පහත දැක්වෙන රීතීන් නියම කරයි.

**1. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීම** - මෙම රීතින් 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ 2017 රීතින් (පරීක්ෂණ කාර්යපටිපාටිය) ලෙස හඳුන්වනු ලබයි.

2. 2017 වර්ෂයේ ---------- දින සිට මෙකී රීතින් බලපැවැත්වෙනු ඇත.

**3. අර්ථ නිරූපණ** - මෙම පනතේ විෂය හෝ සන්දර්භය විසින් අන්‍යාර්ථයක් ඉල්ලා සිටින්නේ නම් මිස,

අ. "පනත" - 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

ආ. ''පුරවැසියා", "කොමිසම", "තොරතුරු නිලධාරියා", ''නම් කරන ලද නිලධාරියා" හා "පොදු අධිකාරිය" යන්න පනතේ අර්ථ දක්වා ලෙසටම අදහස් වේ.

ඇ. ''රහස්‍ය තොරතුරු ඇමුණුම" යනුවෙන් අදහස් වන්නේ පනතේ 5 වෙනි වගන්තිය යටතේ ආවරණය වූ තොරතුරු ඇතුළත් සහ මෙකී රීති ප්‍රකාරව පවත්වන පරීක්ෂණයකදී සපයනු ලබන පරීක්ෂණ වාර්තාවකට ඈඳා ඇති ඇමුණුමකි.

ඈ. "පරීක්ෂණ නොතීසිය/ නිවේදනය" යන්නෙන් අදහස් වන ඇත්තේ පනත යටතේ පරීක්ෂණයක් ආරම්භ කිරීමේදී කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන දැන්වීමකි.

ඉ. "කොමිෂන් සභාවේ නියෝගය" යන්නෙන් පරීක්ෂණය අවසන් වූ පසු කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලබන අවසන් තීරණය අදහස් වේ.

ඊ. "පාර්ශවය" හෝ "තැනැත්තා" යන්නට - පනතේ "පොදු අධිකාරිය" හා "පුරවැසියා" අර්ථ දක්වා ඇති ලෙසටම පුරවැසියෙක් හෝ පොදු අධිකාරියක් අදහස් වනු ඇත.

උ. "අමාත්‍යවරයාගේ නියෝගය'' යන්නෙන් - පනතේ 41 වැනි වගන්තිය අනුව යමින් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ගැසට් කරන ලද නියෝග

ඌ. මෙහිදී භාවිතා කර ඇති සහ මෙකී රීතිවල අර්ථ දක්වා නැති අනෙකුත් සියලුම වචන හෝ වාක්‍ය විධි, අනෙකුත් සියලු වචන හා වාක්‍ය ඛණ්ඩ පනතේ නිර්වචනය කර ඇති ආකාරයම වේ.

**පරීක්ෂණ කාර්යපටිපාටිය**

4. කොමිෂන් සභාව මෙබඳු පරීක්ෂණ, කොමිෂන් සභාවේ කර්තව්‍යය හා කාර්යයන් ඉටුකිරීම සඳහා අදාළ වන හෙයින්, කොටසක් වශයෙන්, අත්‍යාවශ්‍ය බැවින් හෝ ආනුශංගික වශයෙන් අවශ්‍ය වේ නම් සහ/හෝ, පහත දැක්වෙන කාර්යපටිපාටික රීතිවලට අනුකූලව පනතේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා සිය මතය අනුව පවත්වනු ලබයි.

5. 16 වෙනි රීතිය අනුව, ප්‍රසිද්ධ විභාගයක් ලෙස පරීක්ෂණය පවත්වන්නේ නම් කොමිෂන් සභාව විසින් ඒ බව විශේෂිතව දැනුම් දෙනු ඇත.

6. 4 වෙනි රීතිය යටතේ පරීක්ෂණ කටයුතු සිදු කරන විට කොමිෂන් සභාවට සුදුසු යැයි හැඟෙන පරිදි සෙසු ප්‍රසිද්ධ හෝ අධිකරණමය බලධාරීන් විසින් මෙහෙයවා තිබිය හැකි නඩු කාර්ය සටහන් යොදාගනු ඇත.

7. **පරීක්ෂණ නිවේදනය/නොතීසිය (සිතාසි)** - අභියාචනා රීති 18, 19, 20 අනුව නිවේදනය ලබාදීම සම්බන්ධයෙන් වූ දැනුම්දීම්, *අවශ්‍ය වෙනස්කම් සහිතව* සිදු වනු ඇත.

8. **විභාගය පිළිබඳ නොතීසිය (දැනුම්දීම)**

අ. **විභාගය පිළිබඳ නොතීසියක්** නිකුත් කිරීම මගින් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයට මුලපුරනු ඇත. මෙකී නොතීසියේ 1 වන ඇමුණුමෙන් නියම කරනු ලබන ආකාරයට සහ පහත දෑ විශේෂයෙන් සඳහන් කෙරෙනු ඇත.

i. පරීක්ෂණයේ විෂය පථය, සහ අරමුණ, පරීක්ෂණය අවසන් කිරීමට බලාපොරොත්තුවන කාල සීමාව
ii. පරීක්ෂණය පවත්වන්නේ කවුරුන් සම්බන්ධයෙන් සහ කාට එදිරිව ද යන්න.
iii. පරීක්ෂණයේ අරමුණ සඳහා අනිවාර්යයෙන්ම කැඳවිය යුතු හෝ පරීක්ෂණයට පත් කළ යුතු තැනැත්තෝ

ආ. කොමිෂන් සභාව විසින් පරීක්ෂාවට ලක් කරන්නේ කවුරන් එරෙහිවද හෝ කවුරුන් වෙනුවෙන් ද යන්න විභාගය පිළිබඳ නොතීසියේදී දැක්විය යුතු වන අතර, එබඳු දැනුම්දීමක් නිසි භාරගැනීමක් සමග පිළිගැනීම අදාළ පාර්ශවවල යුතුකම වේ.

ඇ. පරීක්ෂණය ආරම්භ වීමට පෙර, අදාල පුරවැසියා/පොදු අධිකාරිය (පාර්ශව) වෙත පරීක්ෂණයේ විෂය පථයට අදාළ තොරතුරු හා ලියකියවිලි ලබාදෙන මෙන් කොමිෂන් සභාවට දන්වා සිටිය හැක.

ඇ. ඉහත වගන්තිවල කුමක් සඳහන් වුවද, ඕනෑම වේලාවකදීපරීක්ෂණයේ විෂය පථය සංශෝධනය කිරීමට, පුළුල් කිරීමට හෝ සීමා කීමට සහ/හෝ පරීක්ෂණයේ අරමුණ සඳහා කැඳවිය යුතු හෝ විමසිය යුතු තැනැත්තන් එකතු කිරීමට/ඉවත් කිරීමට කොමිෂන් සභාවට හැකියාව ඇත.

ඇ. රීති 8(ආ) දක්වා ඇති ආකෘතිය අනුව පරීක්ෂණය පිළිබඳ නිවේදනය අදාළ පාර්ශව වෙත සන්නිවේදනය කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලබයි.

9. **පරීක්ෂණය ආරම්භ කිරීම:** අභියාචනාපටිපාටිය සහ ගාස්තු පිළිබඳ 20වන රීතියේ දක්වා ඇති අවශ්‍යතා හා කාල රාමු, *අවශ්‍ය වෙනස්කිරීම් සහිතව* පරීක්ෂණයේදී අනුගමනය කෙරෙනු ඇත.

10. **පරීක්ෂණය මෙහෙයවීම:**

අ. කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂණය සිදුකෙරෙනු ඇත.

ආ. කොමිෂන් සභාව විසින් සිය අභිමතය පරිදි ලේඛන පදනම් කරගත් පරීක්ෂණයක් ලෙස හෝ පුද්ගලයා කැඳවා සිදුකරන පරීක්ෂණයක් ලෙස හෝ ලෙස හෝ මෙම ක්‍රම දෙකම අදාළ කරගනිමින් පරීක්ෂණය පවත්වනු ඇත.

ඇ. කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට, සිංහල, ඉංග්‍රීසි හෝ දමිළ යන භාෂා වලින් පරීක්ෂණය පැවැත්වෙනු ඇත.

ඈ. කොමිෂන් සභාව විසින් විශේෂිතව දක්වන භාෂාව නොවන වෙනත් භාෂාවකින් යම් තැනැත්තෙක් ප්‍රකාශයක් ලබාදීමට අදහස් කරයි නම්, පරීක්ෂණය පැවැත්වීමට යෝජිතව ඇති දිනයෙන් සතියකට අඩු නොවන දිනයකදී, එබඳු තැනැත්තෙක් සිය භාෂා ප්‍රමුඛතාවය කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, ඒ මත පදනම් ව කොමිෂන් සභාව විසින් එම තැනැත්තාගේ ප්‍රකාශය ලබාගැනීම සඳහා එකී භාෂා වරණය අනුව අවශ්‍ය කටයුතු සූදානම්

කරනු ඇත. මේ රීතියේ අරමුණු සඳහා පුරවැසියන් සහ පොදු අධිකාරීන් වෙත අදාළ වන භාෂා වරණය සිංහල, දමිළ සහ ඉංග්‍රීසි වනු ඇත.

**11. කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම සහ ලේඛන ඉදිරිපත් කිරීම**

අ. කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම සහ ලේඛන ඉදිරිපත කරන ලෙස ඉල්ලා සිටීම සම්බන්ධ සියලු නිවේදන කොමිෂන් සභාව විසින් එබඳු තැනැත්තන් හට හෝ ප්‍රධාන විධායක නිලධාරියාට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යොමු කරනු ඇත.

ආ. පනතේ 15 වෙනි වගන්තය යටතේ කොමිෂන් සභාවට හිමිව ඇති බලතල ක්‍රියාවට නංවමින් කොමිෂන් සභාව විසින් නිවේදන නිකුත් කරනු ලබනු ඇති අතර, මෙකී නිවේදන සමග අනුකූලව කටයුතු නොකිරීම මගින් පනතේ 39 වන වගන්තිය යටතේ වරදක් සංස්ථාපනය කරනු ඇත.

ඇ. මේ රීතිය යටතේ නිවේදනයක් යවනු ලැබූ විට එකී තැනැත්තාගේ සන්තකයේ ඇති සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුව ඇති යම් තොරතුරක් පනතේ 15(ආ) වගන්තිය යටතේ රහසිගතව පරීක්ෂා කළ යුතුව ඇති විටදී හෝ පරීක්ෂණයේදී යම් ප්‍රකාශයක් රහසිගතව ලබාදිය යුතුව ඇති විටදී එම තැනැත්තාට ඒ බව කොමිෂන් සභාව වෙත දැනුම් දිය හැකිය.

ඈ. පරීක්ෂණය සිදු කරන අතරතුර, කාර්යසටහන්වල පාර්ශවයක් නොවන යම් තැනැත්තෙක් කාර්යසටහන්වලට සම්බන්ධිත යැයි කොමිෂන් සභාවට පෙනී යන්නේ නම්, එබඳු තැනැත්තෙකුට ද කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකට පරීක්ෂණයට සහභාගි වන ලෙසට නියම කිරීමට කොමිෂන් සභාවට හැකියාව ඇත්තේය. කොමිෂන් සභාව අදාළ තැනැත්තාට නිවේදනයක් නිකුත් කරමින් මේ බව දැනුම් දෙනු ඇත.

ඉ. මේ රීතිය යටතේ මතු සඳහන් කරන උපරීතිවල කුමක් සඳහන් වුවද, කොමිෂන් සභා විසින් සිදුකරනු ලබන පරීක්ෂණය හෝ කාර්යපටිපාටීන්ගෙන් ස්වකීය අභිලාෂයන් සහ අයිතිවාසිකම්වලට අගතියක් වන බව යම් තැනැත්තෙකුගේ මතය වන්නේ නම්, එබඳු තැනැත්තන් හට කොමිෂන් සභාවට වෙත, සිය මතයට සහාය දක්වන ලියකියවිලි ද සමග ලිඛිත කරුණු කියාපෑමක් සිදුකළ හැක. මෙබඳු කරුණු කියාපෑමක් සලකා බැලීම මත සිය අභිමතය පරිදි පරීක්ෂණය අතරතුරදී එකී පුද්ගලයාට ඇහුම්කන් දීමට කොමිෂන් සභාව ඉඩ ලබාදෙයි.

12. **පරීක්ෂා කිරීමේ සහ තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදය:** කොමිෂන් සභාව විසින් ස්වකීය අභිමතය පරිදි විවෘත හෝ සංවෘත (කැමරා භාවිතයෙන්) කාර්යපටිපාටීන් මගින් සහ, පනතේ 5 වැනි වගන්තියෙන් ආවරණය වන ව්‍යාතිරේඛී තොරතුරු සහ වෙනත් අදාළ රහස්‍ය භාවයෙන් යුත් අභිලාෂයන් සම්බන්ධයෙන් පනතෙන් දැක්වෙන පරිදි පරීක්ෂණයක් පවත්වනු ඇත.

13. **නියෝජනය**

අ. ගාස්තු සහ අභියාචන කාර්යපටිපාටියට අදාළ රීතීන් (21, 22 සහ 23 රීති) මගින් විධිවිධාන සපයන පරිදි පෞද්ගලිකව ගෙන්වා විභාග කිරීමට අදාළ ව නියෝජනය පිළිබඳ රීතීන් අදාළ වෙනස්කම් සහිතව යෙදෙනු ඇත.

ආ. දිවුරුමකට යටත් ව තැනැත්තෙක් විසින් කොමිසම ඉදිරියේ ලබාදෙන සාක්ෂි, එබඳු ප්‍රකාශයන් මගින් බොරු සාක්ෂි ලබාදීම පිළිබඳ අපරාධ නඩු කටයුත්තක් හැරුණු විට වෙනත් කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් ඔහුව/ඇයව විෂය කළ නොහැකි අතර, එය ඔහුට/ඇයට එරෙහිව යොදාගැනීමට ද නොහැක. තවද මෙබඳු ප්‍රකාශයක් ලබා දී ඇත්තේ:

i. කොමිසම විසින් පිළිතුරු ඉල්ලා සිටිමින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරක් ලෙසින් ලෙසින් හෝ
ii. පරීක්ෂණයට අදාළ කරුණක් සම්බන්ධයෙන් විය යුතුය.

**14. ලිපි ලේඛන ඉදිරිපත් කිරීම**

අ. බැලූ බැල්මට සත්‍ය යැයි හැඟෙන, තමන් වෙත සපයා ඇති ඕනෑම ලේඛනයක් කොමිෂන් සභාව විසින් පිළිගනු ඇත.

ආ. පරීක්ෂණ කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කළ ලේඛනයක සත්‍යතාවය, වලංගුභාවය හා පැවැත්ම පිළිබඳ සැකයක් පවතින විට, කොමිෂන් සභාවට තම පරම අභිමතය පරිදි එහි කතෘට හෝ ලේඛනය ලබන්නාට හෝ වෙනත් තැනැත්තෙකුට, ලේඛනය සාමාන්‍යයෙන් ළඟ තබාගෙන සිටිනා පොදු අධිකාරියට කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට එම ලේඛනයේ පැවැත්ම, සත්‍යතාවය හා වලංගුභාවය පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත.

**15. කොමිෂන් සභාවේ නියෝග හා තීරණ:**

අ. කොමිෂන් සභාව විසින් සියලු පරීක්ෂණ කටයුතු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය.

ආ. පරීක්ෂණ කටයුතු අවසන් කිරීමෙන් **මසක් ඇතුළත** කොමිෂන් සභාවට විසින් තම තීරණ හා නියෝග නිකුත් කළ හැකිය.

ඇ. ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටියේ, අභියාචනා රීති 27(2), 27(3) හා 27(4) කොමිෂන් සභාව විසින් පරීක්ෂණයකදී ලබාදෙන නියෝග සහ තීරණවලට යොදාගත යුතුය.

ඈ. කොමිෂන් සභාවේ නියෝග සහ තීරණ ප්‍රසිද්ධ කරනු ලබන අතර, එසේ වුවත් ව්‍යාතිරේකී අවස්ථාවල යම් නිශ්චිත තොරතුරු පනතේ 5 වැනි වගන්තිය යටතේ ආරක්ෂා කළ යුතු වන විටදී එබඳු තොරතුරු තීරණයෙන් සංස්කරණය කර දක්වනු ඇත. එකී සංස්කරණය කරනු ලබන්නේ පනතේ කුමන වගන්තිය යටතේදැයි කොමිෂන් සභාව විසින් සඳහන් කළ යුතු වන අතර, එකී සංස්කරණය කොමිෂන් සභාව විසින් සාධරණීකරණය කළ යුතුය.

ඉ. මතු දැක්වෙන රීතියේ කොන්දේසි තුළ සාදනු ලබන නියෝග සහ තීරණවලට අතිරේකව කොමිෂන් සභාව විසින් **"පරීක්ෂණ වාර්තාව"** ක් නිකුත් කරනු ලැබිය හැකි අතර, එහි ආකෘතිය කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

ඊ. එම පරීක්ෂණ වාර්තාවට අදාළ තොරතුරු, නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒ සඳහා පදනම් සහ එබඳු නිර්දේශ ක්‍රියාවට නංවන ක්‍රමවේදය සහ ආකාරය ඇතුළත් විය යුතුය.

එ. 5 වෙනි වගන්තිය ප්‍රකාරව බැහැර කරනු ලබන ඕනෑම තොරතුරක් සහ පරීක්ෂණයේදී යම් පාර්ශවයක් විසින් සපයනු ලැබූ රහසිගත තොරතුරක් වාර්තාව තුළ එයට ඇමුණුමක් වශයෙන් අන්තර්ග්‍රහණය කිරීමක් අත්‍යාවශ්‍ය යැයි කොමිෂන් සභාව කල්පනා කරන්නේ නම් **"රහස්‍ය තොරතුරු ඇමුණුම"** යන මාතෘකාව යටතේ එය ඇතුළත් කළ හැකිය.

ඒ. පරීක්ෂණ වාර්තාව ප්‍රකාශනයට පත් කළ යුතුය. එම වාර්තාවේ රහස්‍ය තොරතුරු ඇමුණුමක් තිබේ නම් එබඳු ඇමුණුමක් ප්‍රසිද්ධියේ හෙළිදරව් නොකළ යුතු වන අතර, රහස්‍ය තොරතුරු ඇමුණුමේ අන්තර්ගත වන ආකාරයට එම තොරතුරු සපයන්නාගේ

වැඩිදුර විස්තර ද සමග එබඳු ඇමුණුමක් තිබෙන බව සහ එකී විශේෂිත තොරතුරු පනතේ 5 වන වගන්තියේ විෂය පථය යටතේ බැහැරකරනු ලබන්නේ මන්ද යන්න පිළිබඳ කොමිෂන් සභාවේ සාධාරණීකරණය කිරීම ද සමග මහජනයාට දැනගැනීමට සැලැස්විය යුතුය.

16. ප්‍රසිද්ධ විභාග

අ. පරීක්ෂණයට යටත් කාරණයක් මහජනයාට අතිශයින් වැදගත් වේ යැයි කොමිෂන් සභාව කල්පනා කරන්නේ නම් කොමිෂන් සභාවට, 8(ආ) රීතිය යටතේ **"පරීක්ෂණ නිවේදනය-ප්‍රසිද්ධ විභාගය"** යනුවෙන් කියැවෙන (2 වන ඇමුණුම යටතේ නියම කර ඇති) ආකාරයට පරීක්ෂණය පිළිබඳ නිවේදනයක් නිකුත් කර, සිය අභිමතය පරිදි ප්‍රසිද්ධ පරීක්ෂණයක් පැවැත්විය හැකිය.

ආ. කොමිසම විසින් පහත කරුණු මෙම නිවේදනයේ විශේෂයෙන් සටහන් කළ යුතුය. - පරීක්ෂණය ආරම්භ කරන දිනය - නිවේදනය නිකුත් කර දින 14 කට නොඅඩු දිනයකදී විය යුතුය.

i. පරීක්ෂණය සඳහා මහජන නියෝජනයන් භාරගත හැකි කාලපරිච්ඡේදය - මහජනතාවට තම නියෝජනයන් යොමු කළ හැකි ස්වභාවය සහ ආකෘතිය සහ:

ii. කොමිෂන් සභාවට මහජන නියෝජනයන් ලද හැකි ස්ථානය හෝ ස්ථානයන්

iii. ප්‍රසිද්ධ විභාග පිළිබඳ නිවේදනයන්, කොමිෂන් සභාව විසින් සිය වෙබ් පිටුවේ හා අවම වශයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම එක් දිනපතා පුවත්පතක බැගින්වත් පළකරමින් මෙබඳු පරීක්ෂණයක් පැවැත්වෙන බව මහජනයා වෙත දැනුම් දිය යුතු වන අතර, එම දැන්වීම්වල ඉහත කී උප-රීතියේ කොන්දේසි ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ විශේෂ නියමයන් ද එයට ඇතුළත් කළ යුතුය.

iv. ප්‍රසිද්ධ විභාග පිළිබඳ කාර්යපටිපාටීන් මහජනතාවගෙන් ඕනෑම සාමාජිකයෙකු හට විවෘත වේ. කෙසේ වෙතත් මෙකී ප්‍රසිද්ධ විභාගය පවත්වනු ලබන ස්ථානයේ ඇති පහසුකම් සලකා බලමින්, කොමිෂන් සභාව ඉදිරියේ නියෝජනයන් සිදුකරන එකී තැනැත්තන්ගේ සංඛ්‍යාව, කාණ්ඩය හෝ තැනැත්තන්ගේ ස්වභාවය, කොමිෂන් සභාව විසින් ස්වකීය තෝරාගැනීමේ පදනම සහ වරණය අනුව තීරණය කරනු ඇත.

ඉ. ප්‍රසිද්ධ විභාගයක් අතරතුර ඕනෑම තැනැත්තෙකුට හෝ හෝ පොදු අධිකාරියකට එරෙහිව හානිකර කරුණු දැක්වීමක් හෝ වාචික ප්‍රකාශයක් සිදුවන අවස්ථාවකදී, එබඳු තැනැත්තෙක් හෝ පොදු අධිකාරියක් විසින් තමන් විසින්ම හෝ බලයලත් නියෝජනයක් හරහා, අත්‍යාවශ්‍ය යැයි හැඟෙන එබඳු ලේඛන ඉදිරිපත් කිරීමට හෝ කොමිසම විසින් සලකා බැලීම පිණිස අත්‍යාවශ්‍ය යැයි හැඟෙන සිය නියෝජනයන් කොමිෂන් සභාව වෙතට ඉදිරිපත් කළ හැකිය.

ඊ. එබඳු තැනැත්තෙක් සන්තකයේ තිබෙන ඕනෑම තොරතුරක් හෝ ඕනෑම සාක්ෂියක් ප්‍රසිද්ධ විභාගය සඳහා ඉදිරිපත් කරන්නේ නම් ඒ බව ඕනෑම තැනැත්තෙක් හෝ පොදු අධිකාරියක් විසින් කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර මෙබඳු තොරතුරු පනතේ 15(ආ) වගන්තියේ කොන්දේසි යටතේ රහසිගත ව කොමිෂන් සභාව විසින් විමසා බැලෙනු ඇත. උ. ඉහත දැක්වූ 15 වන රීතියේ ප්‍රතිපාදන ප්‍රසිද්ධ විභාගවල වාර්තා සම්බන්ධයෙන් යෙදිය යුතුය.

17. කල්තැබීම

අ. යුක්තියේ නිශ්ඨාවන් ඉෂ්ට කිරීම සඳහා කල් තැබීමක් අත්‍යාවශ්‍ය යැයි කොමිෂන් සභාව විසින් කල්පනා කරන අවස්ථාවලදී, තමන්ගේම මෝසමකට (යෝජනාවකට) අනුව හෝ පරීක්ෂණයේ ඕනෑම පාර්ශවයක් විසින් ඉදිරිපත් කරන අයදුම්පතකට අනුව, ලිඛිතව දක්වා ඇති හේතු ප්‍රකාරව පරීක්ෂණය අවසන් වීමට පෙර එය කල් තැබීමට සහ එය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා වෙනත් වේලාවක් හෝ දිනයක් ලබාදීමට කොමිෂන් සභාවට හැකියාව තිබේ.

ආ. කොමිෂන් සභාව විසින් එබඳු කල්තැබීමක් ලබාදෙනු ලබන්නේ කොමිෂන් සභාවට සුදුසු යැයි හැඟෙන කොන්දේසි මත ය. කොමිෂන් සභාවේ එකී කල්තැබීමේ තීරණය ලිඛිතව දැනුම් දිය යුතු වන අතර, එකී තීරණයෙන් සතියක් නොඉක්මවන කාලයක් තුළ සියලු පාර්ශවයන් වෙත යැවිය යුතුය.

ඇ. කිසියම් පාර්ශවයක් කිසියම් හේතුවක් මත පරීක්ෂණ දිනයේදී පරීක්ෂණය සඳහා පෙනී නොසිටි අවස්ථාවකදී එකී පරීක්ෂණය තවදුරටත් පවත්වාගෙන යාමට හෝ කල් තැබීමට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. මේ අවස්ථාවේදී කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය ලිඛිතව වාර්තා කළ යුතු අතර, තීරණයෙන් සතියක් නොඉක්මවන කාලයක් ඇතුළත සියලු පාර්ශවයන් වෙත දැනුම් දිය යුතුය.

18. **කාර්යසටහන් :** කොමිෂන් සභාව විසින් කාර්ය සටහන් පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතුය. තවද 13 හා 16 යන රීතිවලට අදාළ පාර්ශවයක් හෝ තැනැත්තෙක් කාර්යසටහන්වලට ඇතුළත් වේ නම්, කැමරාවක් ඉදිරියේ එබඳු කාර්යපටිපාටීන් පවත්වා ඇති අවස්ථාවලදී හෝ පනතේ 5 වන වගන්තියේ විෂය පථය ප්‍රකාරව බැහැරකර ඇති තොරතුරු ආරක්ෂා කිරීම පිණිස, තීරණයෙන් එකී තොරතුරු සංස්කරණය කර ඇති අවස්ථාවලදී හැර අනෙකුත් අවස්ථාවලදී, එකී තැනැත්තාට හෝ එකී පාර්ශවයන් ට එම වාර්තාවේ මුල් පිටපත හෝ පිටපතක් පනත ප්‍රකාරව අධීක්ෂණය කිරීමට අයිතිය තිබේ.

19. **දිවුරුම් ප්‍රකාශ හා සෙසු ලේඛණ සංරක්ෂණය:** ගාස්තු සහ අභියාචනා කාර්යපටිපාටිය පිළිබඳ 29 වෙනි රීතිය විසින් විධිවිධාන සපයා ඇති පරිදි, ලේඛන සංරක්ෂණයට අදාළ ප්‍රතිපාදන, අවශ්‍ය වෙනස්කම් සහිතව යොදා ගත යුතුය.

<u>ඇමුණුම 1</u>

**පරීක්ෂණ නිවේදනය (නොතීසිය)**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිවාසිකම පිළිබඳ පනත යටතේ ය.

වෙත :-

ලිපිනය :-

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වෙනි වගන්තිය සහ ඒ සමග කියැවෙන, ඒ අනුව සාදනු ලැබූ පරීක්ෂණ රීතීන්ගේ විෂය පථය ප්‍රකාරව හිමි බලතල අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණය සඳහා මෙමගින් ඔබට දැනුම් දෙනු ලැබේ.

පහත සඳහන් විස්තරය අනුව, පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන ලෙසද, වාචික ප්‍රකාශයක් ලබාදීමට හා පරීක්ෂණයට අදාළ වන තොරතුරු හා ලියකියවිලි ඉදිරිපත් කිරීමට පිණිස ද මෙයින් ඔබට නියම කරනු ලැබේ.

තවද ඔබ සන්තකයේ, බුක්තියේ හෝ භාරයේ ඇතැයි විශ්වාස කිරීමට කොමිෂන් සභාවට හේතු තිබෙන පහත තොරතුරු ඉදිරිපත් කරන ලෙස ද කොමිෂන් සභාව විසින් ඔබට තවදුරටත්, විශේෂිතව නියම කරනු ලබයි.

පනතේ 15 වෙනි වගන්තිය යටතේ කොමිෂන් සභාව ඉදිරියට ඔබ ව කැඳවනු ලබන අතර, මෙකී නොතීසිය යටතේ කරනු ලබන ඉල්ලීම්වලට අනුකූල වීමට ඔබ අපොහොසත් වීම මගින්, පනතේ 39 වගන්තිය ප්‍රකාරව වරදක් සංස්ථාපනය කරයි.

අභියාචන අංකයː
අභියාචනයේ පාර්ශවයෝː
අදාළ පොදු අධිකාරිය/තැනැත්තා/තැනැත්තන්ː
අදාළ පොදු අධිකාරියේ/තැනැත්තාගේ/තැනැත්තන්ගේ ලිපිනයː
පරීක්ෂණ කාර්යපටිපාටිය පවත්වන භාෂාවː

**පසුබිමː**

**පරීක්ෂණයේ විෂය පථයː**

**පරීක්ෂණයේ අරමුණː**

**ප්‍රශ්නගත වාර්තාː**

**ඔප්පු කිරීමේ භාරයː**

**පරීක්ෂණය අවසන් කිරීමට අපේක්ෂිත කාලපරිච්ඡේදයː**

ගැටළු

**පහත ගැටළු සඳහා පිළිතුරු සපයන ලෙස ඔබට නියම කෙරේ.**
ගැටළුව අː
ගැටළුව ආː
ගැටළුව ඇː

ඔබගේ ලිඛිත කරුණු කියාපෑම (සහ අමතර ලියකියවිලි) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ------- මස ------------ දිනය වන විට ඉදිරිපත් කරන්න.

පරීක්ෂණයේදී ඔබ විශ්වාසය තබන/භාවිතයට ගැනීමට අපේක්ෂා කරන ලිපි ලේඛනවල ලැයිස්තුවක් මේ සමග අමුණන්න.

තවද මෙබඳු ඉල්ලීමක් සඳහා ඔබ ලබාදුන් පිළිතුරු හෝ සැපයූ ලියකියවිලි  රහසිගත ව තබාගත යුතු යි නම් ඒ බව දක්වන්න. තවද එබඳු ඉල්ලීමක් සඳහා හේතු ද දක්වන්න.

මෙම නිවේදනයේ දන්වා ඇති භාෂාවට පරිබාහිර භාෂාවකින් පරීක්ෂණ කටයුතු සිදු කිරීමට ඔබ බලාපොරොත්තු වේ නම් ඒ බව දක්වන්න. එය එසේ නම් පරීක්ෂණ කටයුතු ආරම්භ වීමට සතියකට පෙර කොමිෂන් සභාව වෙත ලැබෙන පරිදි ඒ බව සඳහන් කරමින් ඔබ විසින් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් යැවිය යුතුය.

පරීක්ෂණ විභාගය ......... මස...................... දින ........................... ට පැවැත්වෙනු ඇත.

................................
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව
(වෙනුවෙන් හා වෙනුවට )
දිනයː

ඇමුණුම 2

**<u>පරීක්ෂණය පිළිබඳ නිවේදනය - ප්‍රසිද්ධ විභාගය</u>**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පනත යටතේ ය.

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 15 වෙනි වගන්තිය සහ ඒ සමග කියැවෙන, ඒ අනුව සාදනු ලැබූ පරීක්ෂණ රීතීන්ගේ විෂය පථය ප්‍රකාරව  හිමි බලතල අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන පරීක්ෂණය සඳහා මෙමගින් මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.

මේ අනුව පරීක්ෂණයට අදාළව සාක්ෂි ලබාදීමට, අදාළ තොරතුරු සහ ලියකියවිලි ඉදිරිපත් කිරීමට මහජනතාවට හැකිය.

**පරීක්ෂණය සිදු කරන දිනය හා ස්ථානය (ප්‍රසිද්ධ විභාගය)ː**

**ප්‍රසිද්ධ විභාගය සඳහා හේතුවː**

**මහජන නියෝජනයන් ලබාගන්නා කාලපරිච්ඡේදයː**

**මහජන නියෝජනයන් ලබා දිය හැකි ආකාරය සහ  ආකෘතියː**

**පරීක්ෂණයට අදාළ පාර්ශව (ප්‍රසිද්ධ විභාගය)ː**

**පරීක්ෂණය පවත්වන භාෂාව (ප්‍රසිද්ධ විභාගය)ː**

**පසුබිමː**

**පරීක්ෂණයේ විෂය පථයː**

**පරීක්ෂණයේ අරමුණː**

**ප්‍රශ්නගත වාර්තාː**

**ඔප්පු කිරීමේ භාරයː**

**පරීක්ෂණය අවසන් කිරීමට අපේක්ෂිත කාලපරිච්ඡේදයː**

**ගැටළු**

පහත ගැටළු සඳහා පිළිතුරු සපයන ලෙස ඔබට නියම කෙරේ.

ගැටළුව අː
ගැටළුව ආː
ගැටළුව ඇː

ඔබගේ ලිඛිත කරුණු කියාපෑම (සහ අමතර ලියකියවිලි) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ------- මස ------------ දිනය වන විට ඉදිරිපත් කරන්න.

පරීක්ෂණයේදී ඔබ විශ්වාසය තබන/භාවිතයට ගැනීමට අපේක්ෂා කරන ලිපි ලේඛනවල ලැයිස්තුවක් මේ සමග අමුණන්න.

තවද මෙබඳු ඉල්ලීමක් සඳහා ඔබ ලබාදුන් පිළිතුරු හෝ සැපයූ ලියකියවිලි, රහසිගත ව තබාගත යුතු යි නම් ඒ බව දක්වන්න. තවද එබඳු ඉල්ලීමක් සඳහා හේතු ද දක්වන්න.

මෙම නිවේදනයේ දන්වා ඇති භාෂාවට පරිබාහිර භාෂාවකින් පරීක්ෂණ කටයුතු සිදු කිරීමට ඔබ බලාපොරොත්තු වේ නම් ඒ බව දක්වන්න. එය එසේ නම් පරීක්ෂණ කටයුතු ආරම්භ වීමට සතියකට පෙර කොමිෂන් සභාව වෙත ලැබෙන පරිදි ඒ බව සඳහන් කරමින් ඔබ විසින් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් යැවිය යුතුය.

පරීක්ෂණ විභාගය ......... මස...................... දින ........................... ට පැවැත්වෙනු ඇත.

................................

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

(වෙනුවෙන් හා වෙනුවට )

දිනයː